රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: info@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / website: www.pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No: Pns/P8/02/19
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2025.09.15

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

2025 ජාතික විශ්‍රාම දිනය සැමරීම

රාජ්‍ය සේවය වෙනුවෙන් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ මහඟු සේවයක් ඉටුකොට ඉසිඹු ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ එම සුවිශේෂී මෙහෙවර ගෞරවයෙන් සිහිපත් කෙරෙන ජාතික විශ්‍රාමික දිනය ඔක්තෝබර් මස 08 වන දිනට යෙදී ඇත.

02. “ සවිමත් සුවපත් දිරිමත් දිවියක්” යන තේමාව යටතේ මෙවර විශ්‍රාමික දිනය සැමරීමට තීරණය කර ඇති අතර, **ප්‍රධාන සැමරුම් උත්සවය 2025 ඔක්තෝබර් මස 08 වන දින** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කැළණිය වෙදමුල්ල විශ්‍රාමික නිවාඩු නිකේතනයේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

03. ඊට සමගාමීව **2025 ඔක්තෝබර් මස 06 වන දින සිට 10 දක්වා වූ සතිය තුළ** පහත සඳහන් පරිදි කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

i. ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිටින විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙත සමාජයීය, සංස්කෘතික, සෞඛ්‍ය මෙන්ම අධ්‍යාත්මික වටිනාකමක් ගෙන දිය හැකි වැඩසටහනක්/ වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම.

ii. නුදුරු අනාගතයේදී රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යාමට අපේක්ෂා කරන රාජ්‍ය නිලධරයන් විශ්‍රාම ගැන්වීමට අදාළ පූර්ව කටයුතු සිදු කිරීම හා විශ්‍රාම දිවිය සැලසුම් කර ගැනීම සම්බන්ධයෙන් ඔවුන් දැනුම්වත් කිරීම.

04. මේ සම්බන්ධයෙන් ඔබ ලබා දෙන සහයෝගය අතිශයින් අගය කරමි.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත : සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කරු. දැ.ගැ.ස හා අ.ක.ස.